සැ. යු.- මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,675 - 2010 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා - 2010.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1606 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ පළාත් සභාවේ යෝජිත කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10 ක් ඉක්මවා ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 තුළදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

අනුෂ්‍යා සිවරාජා,<br>
මධ්‍යම පළාතේ පළාත් සභාවේ කර්මාන්ත, ක්‍රීඩා, වනිතා කටයුතු,<br>
ග්‍රාම සංවර්ධන, වතු යටිතල පහසුකම් සංවර්ධන,<br>
හින්දු සංස්කෘතික, තරුණ කටයුතු හා අධ්‍යාපන (ද්‍රවිඩ)<br>
අමාත්‍ය.

තැ. පෙ. 41,<br>
ගැටඹේ,<br>
පේරාදෙණිය,<br>
මධ්‍යම පළාතේ පළාත් සභාවේ කර්මාන්ත, ක්‍රීඩා, වනිතා කටයුතු, ග්‍රාම සංවර්ධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, හින්දු සංස්කෘතික, තරුණ කටයුතු හා අධ්‍යාපන (ද්‍රවිඩ) අමාත්‍යාංශයේ දී ය.

**2010 අංක ....................................... දරන මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධනය හා ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා වූ ප්‍රඥප්ති කෙටුම්පත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ නව වැනි උපලේඛනයේ පළමුවැනි ලැයිස්තුවේ 21 වැනි ව්‍යවස්ථාවේ සඳහන් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන විෂයයන් ක්‍රියාත්මක කරමින් මධ්‍යම පළාතේ කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන සේවාවන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යාම සඳහා ද ඊට ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-***

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවන දිනය.

01. මෙම ප්‍රඥප්තිය 2010 අංක.......................................................... දරන "මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධනය හා ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා වූ ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

*1 වැනි කොටස*

**කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව**

මධ්‍යම පළාතේ, කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

02. මධ්‍යම පළාතේ කර්මාන්ත සංවර්ධනය හා ව්‍යාපාර ප්‍රවර්ධනය වෙනුවෙන් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "දෙපාර්තමේන්තුව" වශයෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවක් පිහිටවනු ලැබේ.

මධ්‍යම පළාතේ කර්මාන්ත අධ්‍යක්ෂ.

03. (i) මෙහි මින් මතු "අධ්‍යක්ෂ" වශයෙන් සඳහන් කරනු ලබන මධ්‍යම පළාතේ කර්මාන්ත අධ්‍යක්ෂ 2 වැනි වගන්තිය යටතේ පිහිටවනු ලැබූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය. ඔහු/ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පංතියේ නිලධාරියෙකු විය යුතු අතර, ගරු ආණ්ඩුකාරතුමා විසින් පත් කරනු ලබන්නේ ය.

(ii) දෙපාර්තමේන්තුවේ කාර්ය සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන හා ඉන් අනතුරුව නිකුත් කරන ලද චක්‍රලේඛ හා නීතිරීති අදාල වන්නේ ය.

04. (i) දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යාම සඳහා කර්මාන්ත නියෝජ්‍ය අධ්‍යක්ෂ, කාර්මාන්ත සහකාර අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් නිලධාරීන් ද පත් කරනු ලැබිය හැකිය. — කර්මාන්ත අධ්‍යක්ෂවරයාට සිය බලතල පැවරිය හැකි බව.

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ කර්මාන්ත අධ්‍යක්ෂ වෙත පැවරී ඇති බලතල සහ කාර්යයන් හා පවරනු ලැබූ වෙනත් ඕනෑම කාර්යයක් සහ බලතල කර්මාන්ත නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ වෙනත් නිලධාරීන් වෙත පැවරිය හැක්කේය.

05. (i) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පනවනු ලබන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නියෝග නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේ ය. — අමාත්‍යවරයාගේ බලතල.

(ii) කර්මාන්ත අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබූ යම් නියමයන් හෝ තීරණයන් පිළිබඳව, අභියාචනයක් කරනු ලැබූ විට මෙම ප්‍රඥප්තිය යටතේ ලේකම් විසින් තම අභිමතය පාවිච්චි කරමින් එම තීරණ හෝ නියමයන් වෙනස් කිරීම, නීත්‍යානුකූල වන්නේ ය. එවැනි සෑම අවස්ථාවකදීම ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය. — ලේකම්වරයාගේ බලතල.

06. මධ්‍යම පළාතේ, උසස් කාර්මික සංස්කෘතියක් උදෙසා කර්මාන්ත හා ව්‍යාපාර සේවා සැපයීමේ විශිෂ්ටතම ආයතනය බවට පත් වෙමින් ව්‍යවසායකත්ව සංවර්ධනය, තාක්ෂණික සංවර්ධනය, නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා නව්‍යතාවයකින් යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පළාතේ තිරසාර සංවර්ධනයට ඉහල දායකත්වයක් ලබා දීම මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර වන්නේ ය. — කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර.

07. (i) මධ්‍යම පළාතේ පවතින කර්මාන්ත තව දුරටත් සංවර්ධනය කරමින් හා නව කර්මාන්ත ආරම්භ කරමින් ඒවායේ ආර්ථික ප්‍රතිලාභ උපරිම මට්ටමකට ගෙන ඒම සඳහා මධ්‍යම පළාත කර්මාන්ත සඳහා ආකර්ශනීය ප්‍රදේශයක් බවට පත් කිරීම. — කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුණු.

(ii) කර්මාන්ත අංශයේ ඵලදායීතාවය නංවාලමින් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය වැඩි කිරීමත්, කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවක මණ්ඩලවල ජීවන තත්ත්වය උසස් කිරීමත් සහිතව පළාතේ රැකියා නියුක්තිය නංවාලීම මගින් දිළිඳුකම පිටුදැකීම උදෙසා කරනු ලබන දායකත්වය වැඩි කිරීම.

(iii) මධ්‍යම පළාතට ආවේනික සාම්ප්‍රදායික කර්මාන්ත ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත අලුතින් ආරම්භ කිරීමට හා තිබෙන කර්මාන්ත තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා දිරි ගැන්වීම.

08. මධ්‍යම පළාත තුළ පහත සඳහන් සේවාවන් සහ අවශ්‍යතාවයන් සපුරාලීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය වන්නේ ය :- — පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය.

1. කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල කුසලතා පූර්ණ ශ්‍රම සංවර්ධනය
2. ක්ෂුද්‍ර කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සංවර්ධනය
3. සාම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය
4. ආසාධිත කර්මාන්ත නැවත නගා සිටුවීම
5. කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය
6. කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල තාක්ෂණ සංවර්ධනය
7. කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල ආයතනික සංවර්ධනය
8. කර්මාන්ත ක්ෂේත්‍රයට හිතකර පරිදි නීති රීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
9. කෘෂි කර්මාන්ත නිෂ්පාදනය පදනම් කරගත් කර්මාන්ත ඇති කිරීම හා සංවර්ධනය
10. කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතා සංවර්ධනය
11. කාර්මික මුල්‍ය පහසුකම් සැපයීම සඳහා මැදිහත්කරු වීම
12. කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පුහුණු හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ වෙළඳපල සංවර්ධනය
14. කර්මාන්ත ක්ෂේත්‍රයේ රාජ්‍ය සහ පෞද්ගලික සහසම්බන්ධතාවය වර්ධනය කිරීම හා වාණිජ මණ්ඩල ශක්තිමත් කිරීම
15. කර්මාන්ත ක්ෂේත්‍රයේ අපනයනය ප්‍රවර්ධනය.

පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව සතු බලතල.

09. මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුවේ අරමුණ සපුරා ගැනීමට සහ එයට පැවරී ඇති කාර්යන් ඉටු කිරීමට අවශ්‍ය වන්නාවූ බලතල ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුව සතු විය යුතුය.

කාර්යය මණ්ඩලය.

10. දෙපාර්තමේන්තුවට වරින්වර ඇති වන අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩලය ඉල්ලුම් කිරීමට කර්මාන්ත අධ්‍යක්ෂකට හැකියාව ඇත්තේ ය.

## *II* වැනි කොටස

### මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක මණ්ඩලය

පළාත් කර්මාන්ත උපදේශක මණ්ඩලය.

11. (i) මධ්‍යම පළාතේ කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු පිළිබඳව අමාත්‍යවරයාට පොදුවේ උපදෙස් ලබා ගැනීම සඳහා සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත පළාත් කර්මාන්ත උපදේශක මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් තෝරා පත් කළ යුතු වන්නේ ය.

(ii) මෙම උපදේශක මණ්ඩලය පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත වන්නේය.

1. පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්
2. පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ
3. ඇමතිතුමා විසින් පත් කරන ලද නියෝජිතයන් දෙදෙනෙකු
4. ජාතික ශිල්ප සභාවේ මධ්‍යම පළාත භාර සහකාර අධ්‍යක්ෂ
5. අපනයන වාණිජ මණ්ඩල සභාපති
6. මධ්‍යම පළාතේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ නියෝජිතයෙක්
7. රජයේ කාර්මික ආයතනයක ප්‍රවීන තාක්ෂණික උපදේශකවරයෙක්
8. පළාත් ශිල්ප බල මණ්ඩලයේ සභාපති
9. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අංශයේ අංශ ප්‍රධානී
10. බැංකු නියෝජනය සඳහා එක් අයෙකු
11. ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මධ්‍යම පළාත් සහකාර අධ්‍යක්ෂ.

(iii) කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් නිල බලයෙන් මෙම උපදේශක මණ්ඩලයේ සභාපති වන්නේය.
(iv) කර්මාන්ත අධ්‍යක්ෂ නිල බලයෙන් මෙම උපදේශක මණ්ඩලයේ ලේකම් වන්නේය.
(v) සාමාජිකයින්ගේ ධූර කාලය වසර 02 කි.
(vi) තනතුරෙන් ඉල්ලා අස් වීමෙන් හෝ මිය යාමෙන් හෝ ධූර කාලය අවසන් වීමෙන් හෝ අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ සාමාජිකයෙකුගේ ධූර කාලය අවසන් වන්නේ ය.
(vii) කාලය ඉකුත් වීමේ හේතුවෙන් ධූරය හිස් කරනු ලබන සාමාජිකයින් නැවත පත් කිරීමේ හැකියාවක් ඇත්තේය.
(viii) සභා රැස්වීමක් සඳහා සන පූර්ණය හත් දෙනෙකු විය යුතුය.

උපදේශක මණ්ඩලයේ කාර්යය භාරය.

12. එකී උපදේශක මණ්ඩලය අදාල විෂය පිළිබඳව ගරු ඇමතිතුමා වෙත සුදුසු නිරීක්ෂණ, නිර්දේශ හෝ උපදෙස් ඉදිරිපත් කිරීමත්, පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සේවා වැඩි දියුණු කිරීමත් උපදේශක මණ්ඩලයේ කාර්ය භාරය වන්නේ ය.

13. උපදේශක මණ්ඩලය තෙමසකට වරක් හෝ අවම වශයෙන් රැස්විය යුතුය.

පළාතේ කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව උපලේඛන ගත ආයතනයක් බව.

14. (i) පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් වන අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුවම අදාළ විය යුත්තේ ය.

රහස්‍යභාවය.

(ii) දෙපාර්මේන්තුවේ සියලුම නිළධාරීන්, සේවකයින් නීතියේ සීමාවන් තුළ රහස්‍යභාවය රැකගත යුතුය.

නිළධාරීන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් බව.

15. පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන් සහ සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සළකනු ලැබිය යුත්තේ ය.

## *III වැනි කොටස*

### වැරදි හා දඬුවම්

16. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ මෙම ප්‍රඥප්තිය යටතේ යම් අයෙකුට පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීම වුවමනාවෙන්ම අවහිර කරන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වේ. වැරදි.

17. මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද රෙගුලාසි යටතේ සිදුවන සියලු වැරදි සම්බන්ධයෙන් සාමාන්‍ය පොදු නීතිය බලපාන අතර ඒ අනුව පොදු නීතියේ විධිවිධානයන් යටතේ එකී වරද සම්බන්ධයෙන් නියම කරනු ලැබූ දඬුවම් අදාළ විය යුතුය. දඬුවම්.

## IV වැනි කොටස

### පොදු විධිවිධාන

18. (i) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේදී දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා පළාත තුළ යොදවා ගෙන තිබූ සියලුම ආයතන සතුව පැවති වත්කම් හා දේපල මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබූ වත්කම් හා දේපල වශයෙන් සැළකිය යුත්තේය. දෙපාර්තමේන්තුවේ වත්කම්.

(ii) පහත (iii) වගන්තිය යටතේ හැර පුහුණු අලෙවි හා සේවා මධ්‍යස්ථානවල ගොඩනැගිලි හා භූමිය වෙනත් කටයුතු සඳහා යොදා නොගත යුතුය. ආයතන වෙනත් පොදු කටයුතු වලට යොදවා ගැනීම.

(iii) පොදු වැදගත්කමකින් යුත් වෙනත් කාර්යයන් සඳහා මෙම ආයතන යොදා ගැනීමට අවශ්‍ය වූ විටකදී ලේකම්වරයාගේ හෝ කර්මාන්ත අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේ ය.

19. (i) ප්‍රඥප්තිය යටතේ පිහිටවනු ලැබූ ආයතනවල නඩත්තුව උදෙසා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අයත් වන්නේ ය. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය මූල්‍ය ආධාර.

(ii) ලිඛිත විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තුවේ කටයුතු උදෙසා, දේශීය විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට බාධාවක් නොතිබිය යුතුය.

20. වර්ෂය තුළදී පලාත තුළ, කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු පවත්වා ගන්නා ලද ආකාරය පැන නැගුන ගැටළු, ඒවා විසඳීමට ගත් පියවර ගැන සඳහන් කෙරෙන වාර්ෂික පාලන වාර්තාවක් එක් එක් වර්ෂය ඉකුත්ව මාස හයක කාලයක් ඉකුත් වීමට පෙර, අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය. වාර්ෂික පාලන වාර්තාව.

21. දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට විශේෂ හෝ සාමාන්‍ය හෝ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව විසින් එම විධානයන් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

22. (i) මෙම ප්‍රඥප්තියේ ඇතුලත් ප්‍රතිපත්ති හා විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැක්කේ ය. නියෝග පැනවීමට අමාත්‍යවරයාට ඇති බලය.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කළ දිනයේ සිට හෝ එහි සඳහන් ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(iii) *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු අනුමැතිය සඳහා එම නියෝග හැකි ඉක්මනින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව එය අනුමත කරනු නොලැබූ දිනයේ සිට පරිච්ජින්න කරනු ලැබූ සේ සැළකිය යුතුය.

(iv) යම් නියෝගයක් එසේ පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතුය.

**නව ආයතන පිහිටුවීම.**

23. මධ්‍යම පළාත තුළ, ජනතාවගේ අවශ්‍යතාව හා යෝග්‍යතාව පදනම් කර ගෙන, අමාත්‍යවරයාගේ එකඟත්වය මත නව පුහුණු හා නිෂ්පාදන සේවා හා අලෙවි මධ්‍යස්ථාන සහ කර්මාන්ත සංවර්ධනය සඳහා හිතකර වන ආයතන අලුතින් පිහිටුවිය හැක.

**ආයතන පරීක්ෂා කිරීමේ බලය.**

24. අමාත්‍යවරයා විසින් හෝ අධ්‍යක්ෂ විසින් හෝ බලය පවරනු ලබන අමාත්‍යාංශයෙහි හෝ දෙපාර්තමේන්තුවෙහි නිලධාරියෙකු විසින් පළාත තුළ පිහිටි දෙපාර්තමේන්තුව සතු භූමියකට ඇතුළු වීම හෝ පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

25. පද සම්බන්ධයෙන්, අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියෙහි,

**අර්ථ නිරූපනය.**

"කර්මාන්ත" යන්නෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම හා යන සියලුම කර්මාන්තයන් ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ, කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාව අදහස් වේ.

"ලේකම්" යන්නෙන් මධ්‍යම පළාතේ කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් කෙරේ.

"කර්මාන්ත අධ්‍යක්ෂ" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන යටතේ මධ්‍යම පළාතට පත් කර ඇති කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.**

26. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

10-306

---

## හම්බන්තොට නගර සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට නගර සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ, පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

### යෝජනාව

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥා පනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට හතක් (7%) සමාන බද්දක් පනවා අය කළ යුතු යැයි ද, මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළ කරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නීය.

එසේ වුව ද මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටයක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අය කළ යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට හතක් විය යුතුය.

ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය,
දකුණු පළාත.

2010 අප්‍රේල් මස 06 වැනි දින,
පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

10-326

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.